---

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

---

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දිනද ,ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාවේ සභාපති වරයාට යවා ඇත.

1.2 **මතය**

---

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**

---

(අ) රු. 1,730,000 ක වියදමින් ඉදිකරන ලද වීරහේන ආදාහනාගාරයේ වටිනාකම ද දෙමටපිටිය පොල භූමිය, ප්‍රාදේශීය සභාව සතු පුස්තකාල ගොඩනැගිලි 09 ක්, නාත්තන්ඩිය නගර ශාලා ගොඩනැගිල්ල, ජල ව්‍යාපෘති 02, නාත්තන්ඩිය වෙළඳ සංකීර්ණය, මාරවිල සුපිරි වෙළඳ සංකිර්ණය, දෙමටපිටිය වෙළඳ සංකිර්ණය සහ හාල්පන්විල කඩ කාමරවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ හිඟ මුද්දර ගාස්තු වෙනුවෙන් ලද රු. 1,000,000 ක මුදල ආදායම් ණයගැති ගිණුමේ ගිණුම්ගත නොකර අධිකතා / ඌණතා ගිණුමට බැර කිරිමෙන් ණයගැතියන් හා සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2006 වර්ෂයට අදාල රු. 11,552,637 ක්වූ හිඟ මුද්දර ගාස්තු ණයගැති ගිණුමට හා සමුච්චිත අරමුදලට ගිණුම්ගත කර නොතිබූ නිසා ආදායම් ණයගැතියෝ හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වර්ෂය තුලදී රැස්කරන ලද එකතු කල අගය මත බදු වලින් වියදම් සඳහා දරා තිබූ යෙදවුම් බද්ද හිලව් කලපසු ඉතිරිය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කලද, හිලව් කරන ලද, රු.8,208,838 ක බදු ප්‍රමාණය අදාල වැඩ සටහන් අතර, විසර්ජනය නොකොට තවදුරටත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවිය යුතු ලෙස දක්වා තිබිමෙන් සාවද්‍ය බැර කමක් නිර්මාණය කොට තිබුණි.

(ඉ) 2005 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරිමේදී ද්විගණනය වි තිබූ රු.9,476,772 ක් වූ උපකාර්යාලිය හිඟහිටි වරිපනම් බදු ශේෂය විධිමත් අනුමැතියක් මත ගිණුම් වලින් ඉවත් නොකිරිම හේතුවෙන් සාවද්‍ය ආදායම් ණයගැති ශේෂයක් ගිණුම් වල නිර්මාණය කොට තිබුණි

.

(ඊ) ස්ථාවර වත්කම් වල ඇතුලත්ව තිබූ රු. 106,775 ක් වටිනා කරත්ත 14 ක භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු කරගත නොහැකිවිය.

(උ) ශේෂ පත්‍රයේ දැක්වෙන රු.21,076,019 ක මුදල් ශේෂය තුල 2001 වසරේ සිට 2010 අතර කාල සීමාව තුල අගරු වූ චෙක්පත් 12 ක වටිනාකම වූ රු.838,619 ක් ද, ඇතුලත් වී තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

(අ) වටිනාකම රු.276,365,498 ක්වූ ස්ථාවර වත්කම් විෂයයන් 04 කට අදාල ස්ථාවර වත්කම්ලේඛනය යාවත්කාලින කර නොතිබූ අතර, ඒවාට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 223,812,715 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකිවිය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 56,557,906 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 39,335,265 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපති වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 17,690 | 10,135 | 30,638 |
| (ii) | බදු කුලී | 11,725 | 19,154 | 3,152 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,555 | 1,094 | 97 |
| (iv) | වෙනත් ආදායම් | 89,307 | 54,900 | 132,509 |

2.2.2 **වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂයේ බිල්කල වරිපනම් බදු ආදායම රු. 16,152,705 ක් වූ අතර, රැස්කල මුළු ආදායම රු. 9,070,143 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමින් රු.7,608,449 ක්ද, හිඟ ආදායමින් රු. 1,461,694 ක්ද, එලෙස රැස්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමින් රැස්කර ගෙන තිබුනේ 51% ක් පමණි.

**2.2.3** **වෙනත් ආදායම්**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වෙනත් ආදායම් රු. 89,307,000 ක් වූ අතර, රු.107,431,029 ක් බිල්කිරීම් කර තිබුණි. ඉන් රු. 54,900,344 ක් රැස්කර ගෙන තිබූ අතර, එහි ප්‍රතිශතය 51% ක් විය.

**2.2.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 8,169,436 |
| (ආ) | මුද්දර ගාස්තු | 118,208,924 |

**2.2.5 බදු කුලී**

**----------**

2004 වසරේ සිට 2011 දක්වා බදුකරුවන් 23 දෙනෙකු වෙතින් අයවිය යුතු හිඟ බදුකුලී රු.1,081,223 ක් විය. ඉන් බදුකරුවන් 14 සමග බදු ගිවිසුම් වලට එළඹ නොතිබු හෙයින් බදුකරුවන්ගෙන් අයකරගත යුතුව තිබු රු. 952,411 ක් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක විය.

**2.3 අධිභාර**

**---------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.1,805,437 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

**-----------------------**

2002 වර්ෂයේදි සෝගාතකාගාරයක් ඉදිකිරිම සඳහා ඉඩමක් මිලට ගැනීමට පුද්ගලයන් 04 දෙනෙකු වෙත එක් අයෙකුට රු. 150,000 බැගින් රු.600,000 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණ ද. මෙතෙක් එම ඉඩමෙහි අයිතිය ලබාගැනීමට හෝ එම මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------**

පහත නිරීක්ෂයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ලේඛනය මගින් වැඩ සටහන් 2 ක් යටතේ සෞඛ්‍ය සේවා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු. 2,000,000 ක් වෙන්කර තිබු අතර, එම ව්‍යාපෘතිය ආරම්භ කිරිමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2000 වර්ෂයේ සිට 2004 දෙසැම්බර් 31 දින දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ වෙන්නප්පුව විදුලි ඉංජිනේරු වෙතින් විථි ආලෝක ප්‍රතිපුරණ මුදල් වශයෙන් රු. 1,167,000 ක් සභාවට ලැබිය යුතුව තිබුණි.

(ඇ) පළාත් පාලන මහ සංගමය විසින් 1999 වසරේදී ලබාගෙන තිබූ රු. 100,000 ක මුදල ආපසු ලබාගැනීමට ක්‍රියාකර නොතිබූ අතර, 2007 වර්ෂයේ සිට ලැබිය යුතු පොලී මුදල් ගණනය කිරිමද අත්හැර දමා තිබුණි.

2.6 **අයවැය ලේඛනමය පාලනය**

(අ) සභාව සතු වත්කම් වලින් ලබාගත හැකි බදු ආදායම් හා බලපත්‍ර ගාස්තු වර්ධනය කර ගැනීමට සැලසුම් සකස් කර නොතිබූ අතර, 2012 අයවැය මගින් අපේක්ෂිත ඉහත ආදායම් අයකර ගත නොහැකිවීමෙන් අයවැය ඉලක්ක සපුරාගත නොහැකිව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාග්ධන වැය සඳහා රු.46,800,000 ක් වෙන්කර තිබුණද, සෞඛ්‍ය සේවා, ජල සේවා හා වෙනත් උපයෝගී සේවා සඳහා වැඩි අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) වාර්ෂිකව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණෙන් අයවැය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නිශ්චිත කාල රාමුවක් සකස් කර ගැනිමට නොහැකි වි තිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

.